# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1820/25 - 2013 ජූලි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2013.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : මහ /3 /317/අත්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පමුණුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වරයා විසින් පිළියෙල කර ඇති පි.පි.කො. 9346 හා 2013/07/05 දිනැති හෙක්. 0.0531ක් වූ මූලික පිඹුරේ කැබලි අංක 1:

**කැබලි අංක 01**
ඉඩමේ නම: කැකුණගහ වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: එච්. දූර්ගහක්ෂි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0531.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 අගෝස්තු මස 19 වැනි දින පෙ.ව. 9.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 අගෝස්තු මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ඒවායේ උධෘත සහ අනෙකුත් ලියවිලි පරීක්ෂණයේ දී මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2013 ජූලි මස 23 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහරගම

08 - 385

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KMB/LAN/ACQUI/02/43.
*ඉඩම් අමා. අංකය* : 13/96/WS/128.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 318බී සීවැල්ගම ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි අංක මාර 2545 දරන මූලික පිඹුරෙන් පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම.


*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 01**

ඉඩමේ නම: පොල්ගස්දෙක වත්ත *නොහොත්* ලිංවලහේන; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 02ක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0094 .

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 ඔක්තෝබර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එන්. එච්. එම්. ඩබ්. ඩබ්. එන්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2013 ජුනි මස 03 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 386

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.